චක්‍රලේඛ අංකය : 96/29

මගේ අංකය: 4/ගුරුඅං/01/3099
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
1996. 11. 28 දින.

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවීමෙන් පසු ගුරුවරුන්ගේ වැටුප් ගෙවීම.**

ඉහත කරුණට අදාල ව අප විසින් නිකුත් කර ඇති 95/7 චක්‍රලේඛ මාලාවෙහි උපදෙස් ඇතැම් පළාත් කාර්යාලයන්හි වැටුප් පිළිබඳව කටයුතු කරන නිලධාරීන් විසින් පැහැදිලිව අවබෝධ කරගෙන නොමැති බව පෙනී ගොස් ඇත.

02. 95/7 චක්‍රලේඛයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි අඩංගු වැටුප් පරිමාණ වගු අදාල වනුයේ ශ්‍රී ලංකා ගුරු සේවයට ගුරුවරුන් අන්තර්ග්‍රහණය කිරීමේ දී වැටුප නිශ්චය කිරීම සඳහා පමණී. එය හුදෙක් ඒ ඒ අවස්ථාවට ගැලපෙන පරිදි සකස් කල වගුවක් විනා වැටුප් පරිමාණය නො වේ. ශ්‍රී ලංකා ගුරු සේවයට අදාල වැටුප් පරිමාණයන් පහත සඳහන් පරිදිය.

1 වන පන්තිය :

රුපියල් 105000 - 10 X4800 - 153000

2 වන පන්තිය : I වන ශ්‍රේණිය

රුපියල් 84400 - 7X 3000 -101400

2 වන පන්තිය : II වන ශ්‍රේණිය

රුපියල් 53880 - 15 X 1560 - 77280

3 වන පන්තිය : I වන ශ්‍රේණිය

රුපියල් 42720 - 12 X 1200 - 57120

3 වන පන්තිය : II වන ශ්‍රේණිය

රුපියල් 32520 - 10X780 -2X 1200 -42720

මේ අනුව ඒ ඒ පන්තියේ ඒ ඒ ශ්‍රේණියේ කිසියම් වැටුප් පියවරකට අන්තර්ග්‍රහණය කරන ලද ගුරුවරයෙකුට එදින සිට එම වැටුප් පරිමාණයෙහි උපරිමය දක්වා වැටුප් වර්ධක හිමි වේ. කිසියම් ගුරු භවතෙකු ඒ අනුව තමාගේ වාර්ෂික වැටුප් වැඩිවීම කිසියම් වර්ෂයක් තුළ උපයාගෙන ඇත්නම් නියමිත දිනයෙහි දී අදාල වැටුප් වර්ධකය එම ගුරු භවතාට ගෙවිය යුතුය. වැටුප් වර්ධක තවදුරටත් හිමි නොවන්නේ කිසියම් ගුරු භවතෙකු ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි අදාල වැටුප් පරිමාණයෙහි උපරිමයට පැමිණ ඇත්නම් පමණි.

උදාහරණයක් වශයෙන් :

3: II ශ්‍රේණියේ ගුරුවරයෙකුට රුපියල් 42720 වැටුප් පියවර දක්වා ද,
3: I ශ්‍රේණියේ ගුරුවරයෙකුට රුපියල් 57120 වැටුප් පියවර දක්වා ද,
2: II ශ්‍රේණියේ අයෙකුට රුපියල් 77280 වැටුප් පියවර දක්වා ද,
2: I ශ්‍රේණියේ අයෙකුට රුපියල් 101400 වැටුප් පියවර දක්වා ද,

වැටුප් වර්ධක උපයා ගත හැකිය.

ඇතැම් කාර්යාලයන් 2: II ශ්‍රේණියෙහි 71040 වැටුප් පියවරට පැමිණි පුහුණු ගුරුවරයෙකුට ද, 72600 පියවරට පැමිණි නුපුහුණු උපාධිධාරීන්ට හා පුහුණු සාමාන්‍ය උපාධිධාරීන්ට ද, එම පියවරට පැමිණි නුපුහුණු ගෞරව හා පුහුණු ගෞරව උපාධිධාරීන්ට ඉන් ඔබ්බට වැටුප් වර්ධක ලබාදීම ප්‍රතික්ෂේප කර තිබේ.

අන්තර්ග්‍රහණයෙහි දී 2 : II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට ඉහත සඳහන් පරිදි ඒ ඒ වැටුප් පියවරට පැමිණි ගුරුවරුනට වැටුප් පරිමාණයෙහි මීළඟ වැටුප් පියවර නියමිත දිනයේදී ලබා දිය යුතුව තිබේ.

03. මේ අනුව සියළුම ගුරුවරුන් වෙත ඔවුන් අන්තර්ග්‍රහණය කරනු ලැබ සිටින වැටුප් පරිමාණයෙහි උපරිමය දක්වා වැටුප් වර්ධක උපයා ගැනීමට හිමිකම් ඇති සේ සලකන ලෙසත්, වැටුප් පරිවර්තන වගුව හා වැටුප් පරිමාණයන් පිළිබඳ පැහැදිලිව තේරුම් ගන්නා ලෙසත්, දන්වා සිටිනු ලැබේ.

ඩෙයිහාමුදලක උපසේන
අතිරේක ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම් වෙ[illegible]

පිටපත්:- 1. සියළුම පළාත් ගණකාධිකාරිවරුන් වෙත,
2. සියළුම කලාප හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවල මාණ්ඩලික සහකාරවරුන්.
3. සියළුම ගුරු සිගමි වෙත.

ම/14.